# ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

## උපකුලපති තනතුර

ශ්‍රී ලංකාවේ ධීවර, නාවික හා සාමුද්‍රික ක්ෂේත්‍රයන්හි පිරිස් බල අවශ්‍යතාවය පුරවාලනු පිණිස 2014 අංක 31 දරන පාර්ලිමේන්තු පනත මගින් ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ස්ථාපනය කරන ලදී. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ උපකුලපති තනතුර සඳහා ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් අයදුම්පත්/ නාම යෝජනා කැඳවනු ලැබේ. අයදුම්කරුවන්/ නම් කරන ලදවුන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය. සාර්ථක අයදුම්කරු/ නම් කළ අය පත්වීම ලද දිනයේ සිට වසර හතරක කාලයකට හෝ ඔහු/ ඇය වයස අවුරුදු 65 සම්පූර්ණ වනතුරු පළමුව එළැඹෙන අවස්ථාව දක්වා තනතුර හොබවනු ඇත.

කලාපයේ නාවික හා ධීවර අධ්‍යාපනයේ අනර්ඝත්වයේ කේන්ද්‍රස්ථානය වනු පිණිස නාවික, සමුද්‍රීය හා ධීවර ක්ෂේත්‍රයන්ට නවෝත්පාදක විසඳුම් ලබාදීම ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ දෘෂ්ටිය වේ.

සාගර, නාවික හා සමුද්‍රීය ක්ෂේත්‍රයේ විශිෂ්ට හා ප්‍රමුඛතම විශ්වවිද්‍යාලයක් වන සාගර විශ්වවිද්‍යාලය, ප්‍රථම උපාධි පිරිනමන "**උසස් අධ්‍යාපන**" වැඩසටහන් හා ඩිප්ලෝමා හා සහතික පිරිනමන වෘත්තීය අභ්‍යාස වැඩසටහන් වශයෙන් අංශ දෙකකින් ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකා රජය නාවික කර්මාන්තයේ සංවර්ධනය කෙරෙහි සිය දැඩි කැපවීම තුළ උසස් තත්ත්වයේ වෘත්තිකයන් බිහිකරලීමට අධ්‍යාපනය හා පුහුණුව ප්‍රවර්ධනය කරමින් සිටී. තවදුරටත්, මනා ආර්ථික කලාපයේ නාවික සම්පත් සන්නද්ධ කිරීමට මග පෙන්වන පර්යේෂණ හා නවෝත්පාදන මගින් ජාතික ආර්ථිකය ප්‍රබල "**සාගර ආර්ථිකයක්**" බවට සම්පූර්ණයෙන් වෙනස් කරලීමද රජයේ උපාය මාර්ගයට ඇතුළත් වේ. උපකුලපති ඔහුගේ/ ඇයගේ බුද්ධිමය හා කළමනාකරණ විශිෂ්ටත්වය මගින් විශ්වවිද්‍යාලයේ දෘෂ්ඨිය හා අභිමතාර්ථයන් ඉදිරියට ගෙන යාමට දක්මක් සහිත පුද්ගලයකු විය යුතුය. ඊට අමතරව, උසස් අධ්‍යාපනය, හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තීන් පරිදි දේශීය හා විදේශීය රැකියා වෙළඳපලවල අවශ්‍යතාවයන් හඳුනාගැනීමටද උපකුලපතිවරයා කැඳවනු ලැබේ.

පර්යේෂණ හා සංවර්ධනය සහ වෘත්තීය පුහුණුව තුළින් විශ්වවිද්‍යාලයේ දියුණුව සඳහා දීර්ඝ කාලීනව තහවුරු වූ අගයන් ශක්තිමත් කරලීමට උපකුලපතිට හැකි විය යුතුය. ඔහු/ ඇය සවිමත් පර්යේෂණ පැතිකඩක්, විවිධ අභිලාෂයන් සහිත කණ්ඩායම් හා සමග අරමුණු සහිතව අන්‍යෝන්‍යව ක්‍රියා කිරීමට සාක්ෂාත් කළ නායකත්ව ගුණාංග හා අන්තර් පුද්ගල නිපුණතා සහිත, ප්‍රතිපත්ති විෂයයන් පිළිබඳ පැහැදිලි අවබෝධයක් සහ අනර්ඝ සන්නිවේදන නිපුණතා හා සමග ශිෂ්‍යයින්ගේ හා කාර්ය මණ්ඩලයේ විවිධ වූ අභිලාෂයයන් උද්දීපනය කරලීමේ හැකියාව ඇතුළු උසස් අධ්‍යයන තත්ත්වයකින් හා සම්පූර්ණත්වයෙන් යුක්ත අයකු විය යුතුයැයි අපේක්ෂා කෙරේ.

උපකුලපති විශ්වවිද්‍යාලයේ පූර්ණකාලීන නිලධාරියෙකු වන අතර, ප්‍රධාන විධායක මෙන්ම ප්‍රධාන අධ්‍යයන නිලධාරිද වේ. උපකුලපති විශ්වවිද්‍යාලයේ ගිණුම් නිලධාරිද වේ. ඔහු/ ඇය සාගර විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ හා අධ්‍යයන කවුන්සිලයේ යන දෙකෙහිම නිල බලයෙන් සාමාජිකයකු මෙන්ම සභාපතිද වේ. ඔහු/ ඇය සාගර විශ්වවිද්‍යාලය තුළ විනය පවත්වාගෙන යාම පිළිබඳව වගකිව යුතුවේ. 2014 අංක 31 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන හා යම් අදාළ විධිවිධාන යථා පරිදි අනුගමනය කළ බවට හා එකී අරමුණ සඳහා අවශ්‍ය වේ යයි සිතෙන එම සියලුම බලතල ක්‍රියාත්මක කිරීම සහතික කරලීම උපකුලපතිවරයාගේ රාජකාරී වේ. උපකුලපති, අධ්‍යයන නායකත්වය ලබාදීමටත්, වේගවත් කළමනාකරණ ප්‍රතිපත්තීන් හඳුන්වා දීම සහ පාලන මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය පවත්වාගෙන යාම සඳහා වගවිය යුතු අතර, ඒ නිසාම අධ්‍යයන විශිෂ්ටත්වයේ සහ යහපාලනයේ මූලධර්මය පිළිගත යුතුය. පාරදෘෂ්‍ය බව, වගවීම, ප්‍රජාතාන්ත්‍රීය කළමනාකරණය සහ එළදැයී අපක්ෂපාතී නායකත්වය පවත්වාගෙන යාමටද උපකුලපති වගබලා ගත යුතුය. විශ්වවිද්‍යාල පද්ධතියේ ඉහළතම අධ්‍යයන වැටුප් පරිමාණයේ පිහිටුවීමටත් අනුමත දීමනා ලබාගැනීමටත් උපකුලපති සුදුසුකම් ලබයි.

**අයදුම්පත්/ නාමයෝජනා සමග පහත සඳහන් ලිපිලේඛන ඉදිරිපත් කළ යුතු වේ.**

- ❒ **අයදුම්කරුගේ / නම් කරන ලද අයගේ උපන් දිනය ඇතුළුව සම්පූර්ණ ජීව දත්ත ප්‍රකාශනයක්.**
- ❒ **විශ්වවිද්‍යාලයේ සංවර්ධනය සඳහා වන දැක්ම පිළිබඳ නිවේදනයක් සහ තෝරා පත්කර ගතහොත් අයදුම්කරු/ නම් කළ අය මුදුන් පමුණුවා ගැනීමට කරනු ලබන යෝජනා පිළිබඳ කෙටි වාර්තාවක්.**
- ❒ **ධූරය දරන උපකුලපති අයදුම්කරුවකු වන හෝ අයදුම්කරු මීට පෙර විශ්වවිද්‍යාලයක උපකුලපති තනතුරක් හෙබවූවකු වන විටදී ඔහු/ ඇය, ඉහත (II) වන ඡේදයේ සඳහන් ලිපිලේඛන වලට අමතරව, ඔහුගේ/ ඇයගේ ධූර කාලය තුළ අත්පත් කරගත් ජයග්‍රහණයන් / නිපුණතාවයන් උද්දීපනය කරමින් වාර්තාවක් සැපයිය යුතුවේ.**
- ❒ **නම් කරන අයකු නම් නාම යෝජකගේ කැමැත්ත දක්වන ලිපියක්.**
- ❒ **අයදුම්කරු / නම් කළ අය රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවයේ නියුතු වූවකු නම් ඔහු/ ඇය මෙම තනතුරට තෝරා පත්කර ගතහොත් සේවයෙන් මුදා හැරීමට හැකි බවට සේව්‍යයාගෙන් ලිපියක්.**

අයදුම්පත්/ නාම යෝජනා මුද්‍රා තැබූ කවරයක බහා කොළඹ 15 මට්ටක්කුලිය, පඤ්ඤානන්ද මාවත, නො. 51, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ, ලේඛකාධිකාරී වෙත යොමු කොට 2021 අප්‍රේල් 30 දින ප.ව. 3.00 ට පෙර අතින් ගෙනැවිත් භාරදිය යුතුය. නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් ඉහත කාර්යාලය වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය. අයදුම්පත් / නාමයෝජනා බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ "**උපකුලපති තනතුර**" යනුවෙන් සඳහන් කළ යුතුය.

ඇගැයීම් කමිටුව මගින් කෙටි ලැයිස්තුගත කොට පාලන මණ්ඩලය මගින් අනුමත කළ අයදුම්කරුවන්ට අවම වශයෙන් විනාඩි 10 ක එනමුත් විනාඩි 15 නොඉක්මවන කාලයක ඉදිරිපත් කිරීමක් කරන ලෙසට ආරාධනා කෙරේ. විශේෂ තත්ත්වයක් තුළ, යම් අපේක්ෂකයකුට විශේෂ පාලක මණ්ඩල රැස්වීමට පැමිණීමට අවස්ථාවක් නොමැති විට එම ඉදිරිපත් කිරීම වීඩියෝ තාක්ෂණය මගින් ඉදිරිපත් කිරීමට අවසරය ලැබෙනු ඇත. අයදුම්කරුවන් තිදෙනෙකුගේ නම් නිර්දේශ කරමින් ඉදිරිපත් කරන විශේෂ පාලක මණ්ඩලයේ වාර්තාව වැඩිදුර කටයුතු කිරීම සඳහා නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කෙරෙනු ඇත.

**ලේඛකාධිකාරී,**<br>
**ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය,**<br>
**නො. 51, පඤ්ඤානන්ද මාවත,**<br>
**මට්ටක්කුලිය, කොළඹ 15.**<br>
**2021 මාර්තු 31.**